Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

GMOA ESTABLISHED IN 1926 TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

30-11-2011

පුවත්පත් නිවේදනයයි.

**විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟය සහ වෛද්‍ය පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ ක්‍රියාකලාපය.**

රජයේ පමණක් නොව පෞද්ගලික රෝහල්වල පවා ඇති දිගු පෝලිම් ශ්‍රී ලංකාවේ පවතින විශේෂඥ වෛද්‍යවරුන්ගේ දැඩි හිඟයට ප්‍රමාණවත් සාක්ෂි සපයයි. මෙම හිඟය ඇතැම් ක්ෂේත්‍ර වල ඉතාමත් උග්‍ර වී ඇති අතර උරස් ශල්‍ය වෛද්‍ය, ස්නායු ශල්‍ය වෛද්‍ය සහ මනෝ විශේෂඥ වෛද්‍ය යන ඒවා ඒ සඳහා නිදසුන් කිහිපයක් පමණි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ජනගහනයෙන් සෑම 50,000 කටම අවම වශයෙන් මානසික රෝග සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් එක් අයෙක් වත් සිටිය යුතුය. ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යපන ක්ෂේත්‍රයේ නියුතු වුවන්ද ඇතුළුව මිලියන 20 ක් වූ ජනතාව සඳහාම සිටිනුයේ මානසික රෝග විශේෂඥයන් 50ක් පමණ ප්‍රමාණකි. එය 400,000 :1 ක අනුපාතයක් ගනී.

මෙම තත්ත්වය මත ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍ය සේවාවේ ප්‍රමාණාත්මක භාවය සම්බන්ධව දැඩි ගැටළු පැන නැගී ඇත. දිනකට වාර්තා වන සියදිවි නසා ගැනීම්, කාන්තා හා ළමා අතවර, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය සහ වෙනත් ද්‍රාමරික ක්‍රියාකාරකම් සලකා බැලීමේ දී එය මනාව සනාථ වේ.

තත්ත්වය එසේ තිබියදී, ඉතාම පෞද්ගලික හේතු මත මානසික සෞඛ්‍ය ඩිප්ලෝමාව නවතා ලීමට කිහිප දෙනෙකු විසින් දරන උත්සහයක් ද පවතින බවට අපට වාර්තා වී ඇත.එමෙන්ම මේ වන විට වෛද්‍ය පශ්චාත් උපාධි අධ්‍යාපන ආයතනය මගින් වසරකට බිහිකරන විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යව දැඩි කප්පාදුවකට ලක්කර ඇත.මේ සම්බන්ධව අපගේ දැඩි විරෝධතාවය පශ්චාත් උපාධි අධ්‍යපන ආයතනය වෙත පලකරණු ලබන අතර රටේ ජනතාවගේ සෞඛ්‍ය සඳහා වගකියන, ගරු සෞඛ්‍ය අමාත්‍යවරයාගේ අවධානය මේ සඳහා යොමු කරනු කැමැත්තෙමු.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්